## බලන්ගොඩ නගර සභාවේ
## ස්වයංක්‍රීය විද්‍යුත් පුස්තකාලය හා තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය
## e-balangoda තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති මධ්‍යස්ථානය

# විදුනැණ පියස

හැදින්වීම:

මිනිසාගේ මූලික අවශ්‍යතා වන්නේ ආහාරපාන, ඇඳුම් හා නිවාස වේ. නමුත් වත්මන් සමාජ විපර්යාස තුල තවත් මූලික අවශ්‍යතාවයක් බිහිවිය. එනම් තොරතුරුය. තොරතුරු වලින් තොරව වත්මන් සමාජයේ ජීවත්වීම අපහසුය. තොරතුරු තාක්ෂණයෙන් පිරිපුන් තොරතුරු මධ්‍යස්ථානයක් බළන්ගොඩ නාගරික ජනතාව වෙත තිළිණ කිරීමට අදහස් කලේ මේ නිසාය. උපතේ සිට මරණය දක්වා සපයන සේවා වල තොරතුරු සේවා ලබා දීමද දැන් බළන්ගොඩ නගර සභාව විසින් ශ්‍රී ලංකාවේ පළමු වතාවට ඉටු කරනු ලබයි.

අරමුණ :

බළන්ගොඩ නගර සභා බලප්‍රදේශයේ ජනතාව හා බළන්ගොඩ නගරය භාවිතා කරමින් සේවා සපයා ගන්නා ජනතාව වෙත තොරතුරු තාක්ෂණික මෙවලම්, දැනුම හා අවශ්‍ය තොරතුරු සමීප කරවීම තුලින් ඔවුන්ගේ එදිනෙදා කටයුතු හා අධ්‍යාපනික කටයුතු සාර්ථක මෙන්ම ඵලදායි කර ගැනීමට අවශ්‍ය තොරතුරු ලබා දීම සහ සහය ලබා දීම.



සිදුකරන සේවාවන් :

## 01. තොරතුරු සැපයීම (නොමිලයේ සිදුකරයි.)

- **රාජ්‍ය අංශයේ සේවා පිළිබඳ තොරතුරු**

රාජ්‍ය ආයතන වලින් කෙරෙන සේවා පිළිබඳ තොරතුරු ලබා දීම මගින් ජනතාවට අදාල රාජ්‍ය ආයතනයට නොයා ඒ පිළිබඳ තොරතුරු ගැනීමට අවස්ථාව ලබාදේ. තවද විවිධ රාජ්‍ය ආයතන මගින් ලබා දෙන අයදුම්පත්, දත්ත සංඛ්‍යා ලේඛණ ආදිය ලබා ගැනීම පහසුකම් සැලසීම මෙමගින් සිදුකෙරේ.

- **රාජ්‍ය අංශයේ ආයතන පිළිබඳ තොරතුරු**

විවිධ රාජ්‍ය ආයතන පිහිටි ස්ථාන, ශාඛා ඇති ස්ථාන හා ඒවායේ දුරකථන අංක යනාදිය පිළිබඳ තොරතුරු ලබා දීම සිදු කෙරේ.

- **සංචාරකයින් වෙත සංචාරක ස්ථාන පිළිබඳ තොරතුරු**

බළන්ගොඩ නගරය හරහා යන සංචාරකයින් සඳහා එම ස්ථාන පිළිබඳ තොරතුරු ලබා දීම හා ගමන් මාර්ග පිළිබඳ දැනුවත් කිරීම.

## 02. රැකියා බැංකුව (නොමිලයේ සිදුකරයි.)

- ප්‍රදේශයේ සුදුසුකම් ලත් රැකියා අපේක්ෂකයින්ගේ දත්ත ගබඩාවක් පවත්වා ගෙන යාම.

රැකියා අපේක්ෂකයින්ගේ දත්ත ගබඩාවක් පවත්වාගෙන යාම තුලින් සේවකයින් සේවය සඳහා සොයන ආයතන වලට රැකියා අපේක්ෂකයින්ගේ තොරතුරු ලබා දීම සිදුකෙරේ.

- රැකියා පිළිබඳ සොයා බලා රැකියා අපේක්ෂකයින් ඒ රැකියා වලට යොමු කිරීම.

ප්‍රාදේශිකව මෙන්ම පිටපළාත් වල ඇති රැකියා පිළිබඳ තොරතුරු සොයා බලා අප ආයතනයේ ලියාපදිංචි රැකියා අපේක්ෂකයින්ව එම රැකියා සඳහා යොමු කිරීම සිදුකෙරේ.

## 03. ඉන්ටර්නෙට් පහසුකම් ලබා දීම.

➢ **ඉන්ටර්නෙට් භාවිතය සඳහා පහසුකම් ලබාදීම.**

ඉන්ටර්නෙට් භාවිතා කිරීම සඳහා ජනතාවට අවස්ථාවක් ලබා දීම මෙමගින් සිදුකෙරේ. පැයක ඉන්ටර්නෙට් භාවිත කාලයක් සඳහා රු. 35/= + VAT+NBT අය කෙරේ. ඉන්ටර්නෙට් භාවිතා කිරීමේදී ජනතාවට අවශ්‍ය මාර්ගෝපදේශනය ලබා දීමටද සැලසුම් කර ඇත.

➢ **ඉන්ටර්නෙට් තුලින් දුරස්ථ වීඩියෝ සංවාද හා ඇමතුම් සඳහා අවස්ථාව ලබාදීම.**

ඉන්ටර්නෙට් භාවිතයෙන් දුරස්ථ වීඩියෝ සංවාද හා ඇමතුම් ලබා ගැනීමට අවශ්‍ය කැමරා, හෙඩ්පොන් (Headphone) හා අනෙකුත් සියළු පහසුකම් වලින් යුක්තය. මෙහිදීද භාවිත කරන්නන් සඳහා අවශ්‍ය මාර්ගෝපදේශනය ලබා දීම සිදු කෙරේ. පැයක ඉන්ටර්නෙට් භාවිත කාලයක් සඳහා රු. 35/= + VAT+NBT අය කෙරේ.

## 04. පරිගණක පාඨමාලා පැවැත්වීම.

➢ **එක්දින ඉන්ටර්නෙට් වැඩමුළු පැවැත්වීම (රාජ්‍ය අංශය / වෙනත්)**

ඉන්ටර්නෙට් පිළිබඳ ආධුනිකයින් සඳහා මෙම වැඩමුළුව සකස් කර ඇත. (ඉන්ටර්නෙට් ගැන වැඩිදුර ඉගෙන ගැනීමට අපේක්ෂිත අයටත් මෙය යෝග්‍ය වේ.) මෙමගින් ඉන්ටර්නෙට් මගින් තොරතුරු සොයා ගැනීම, විවිධ සේවා ලබා ගැනීම, ඊ-මේල් භාවිතය ආදී සියල්ල ආවරණය කෙරේ. වැඩමුළුව අවසානයේ සහතිකයක් ප්‍රදානය කෙරේ. එක් වැඩමුළුවකට 08 දෙනෙකු පමණක් සහභාගි කර ගැනේ.

කාලය : දින 01 යි.
වේලාව : පෙ.ව. 8.30 සිට ප.ව. 4.30 දක්වා
ගාස්තුව : එක් අයෙකු සඳහා රු. 500/= + VAT +NBT

➢ **බ්ලොග් අඩවි නිර්මාණය හා සිංහල යුනිකෝඩ් භාවිතය පිළිබඳ එක්දින පුහුණු වැඩමුළුව**

සිංහල යුනිකෝඩ් (Unicode) භාවිතය පිළිබද පුළුල් අවබෝධයක් මෙම වැඩමුළුව මගින් ලබාදේ. තවද තනිව බ්ලොග් අඩවියක් නිර්මාණය කිරීම හා සංවර්ධනය කිරීම, පවත්වාගෙන යාම, එය විශාල පිරිසකට කියවීම සඳහා ප්‍රසිද්ධ කිරීම යනාදී තවත් බොහෝ කරුණු මෙමගින් ප්‍රයෝගිකව පුහුණු කිරීමට සැලසුම් කර ඇත.

මෙම වැඩමුළුවට සහභාගිවීමට නම් පරිගණක භාවිතය පිළිබද සාමාන්‍ය දැනුමක් අනිවාර්යය වේ.

කාලය : දින 01 යි.
වේලාව : පෙ.ව. 8.30 සිට ප.ව. 4.30 දක්වා
ගාස්තුව : එක් අයෙකු සඳහා රු. 500/= + VAT+NBT

එක් කණ්ඩායකමකට 08 දෙනෙකු පමණක් සහභාගි කර ගැනේ. පාඨමාලව අවසානයේ සහතිකයක් ප්‍රදානය කෙරේ.



## 05. විද්‍යුත් පුස්තකාල පහසුකම් ලබාදීම.

**e-library**
**Balangoda**

බළන්ගොඩ නගර සභා පරිශ්‍රයේ පවත්වාගෙන යනු ලැබූ ස්වංයක්‍රිය විද්‍යුත් පුස්තකාලය ,විද්‍යුාන පියස, සමගින් ඒකාබද්ධ කරනු ලැබේ.

ලෝකයේ තොරතුරු, වටිනාම වස්තුව බවට පත් වෙමින් පවතින වර්තමාන කාලයේ තොරතුරු ඉක්මනින් හා පහසුවෙන් සොයා ගැනීම සඳහා විවිධ මෙවලම් බිහිවේ. විද්‍යුත් පුස්තකාලයක් යනු ඉතා වේගයෙන් තොරතුරු සොයා ගත හැකි බහුමාධ්‍ය මෙවලම් රැසකින් සමන්විත පුස්තකාලයකි.

මෙහි විශේෂත්වය වන්නේ මෙහි ඇත්තේ සාමාන්‍ය කඩදාසි සහිත පොත් පත් නොවීමයි. මෙහි ඇති බහුමාධ්‍ය පොත්පත් ඔබ කියවිය යුත්තේ පරිගණක තිරයේය. එසේ කියවීමට ඔබට නොහැකිනම් පරිගණකය ඔබට ඇසෙන සේ එම පොත් කියවයි. ඔබට තිබෙන්නේ අසා සිටින්නට පමණි. ක්ෂනිකව පොතේ ඕනෑම පිටුවකට පිවිසීමට පවා ඔබට හැකියාව ඇත.

මෙහි ඇති බහුමාධ්‍ය විශ්වකෝෂ ඔබට අවශ්‍ය තොරතුරු මොහොතකින් ඔබ දෑස් ඉදිරිපිටට කැඳවයි. ඔබ සොයන තොරතුරු සම්බන්ධ විඩියෝ දර්ශන, ජායාරූප. පමණක් නොව ශබ්දයද ඔබට ඇසීමට සලස්වයි.

විද්‍යුත් පුස්තකාලය සතු වන ස්වංක්‍රීයව උගන්වන පරිගණක වැඩසටහන් ඔබ නොදන්නා විෂයන් ඉතා සරලව, අන්තර් ක්‍රියාකාරී පැවරුම් සහිතව ඔබට කියාදෙයි, ඔබ ඉගෙනගත් දේ පිළිබඳ ප්‍රශ්න පත්‍රවලටද පිළිතුරු ලියා ඒවායේ වැරදි නිවැරදි ආදිය පරීක්ෂා කර ඔබට වැරදී ඇති තැන් නැවත ඔබට ඒ මොහොතේම කියදෙයි.

මෙහි විද්‍යුත් සඟරා, අධ්‍යාපනික වටිනාකමක් ඇති විඩියෝ වාර්තා වැඩසටහන්, චිත්‍රපටි, නාට්‍ය හා විවිධ සිතියම් වර්ගද ආදියද ඔබේ පරිහරණය සඳහා තබා ඇත.

මෙම විද්‍යුත් පුස්තකාලයේ තවත් සුවිශේෂාංගයක් වන්නේ මෙය සම්පූර්ණයෙන්ම ස්වයංක්‍රීයව ක්‍රියාත්මක වීමයි. මෙය භාවිතා කරන්නාට ඔහු හෝ ඇයගේ නමින්ම පරිගණකය විසින් කථා කර අවශ්‍ය තොරතුරු දැනුම් දෙයි.

විද්‍යුත් පුස්තකාලය මගින් ලබා ගත හැකි සේවා :

- විද්‍යුත් පොත් පත් පරිහරණය
- බහුමාධ්‍ය විශ්වකෝෂ පරිහරණය
- අධ්‍යාපනික වීඩියෝ දර්ශන, වීඩියෝ චිත්‍රපටි, නාට්‍ය පරිහරණය
- ස්වයංක්‍රීය අධ්‍යාපනික වැඩසටහන් පරිහරණය
- සිතියම් පිළිබඳ අධ්‍යනය කිරීම

විවෘත කරන දින හා වේලාව :

සතියේ සෑම සඳුදා සිට සිකුරාදා දක්වා පෙ.ව 8.30 සිට ප.ව 4.30 දක්වා විවෘතව ඇත.

අයකරන ගාස්තු :

දින 30 ක කාලයක් සඳහා රු. 250 + VAT +NBT කි. දිනකට පැය 02 බැගින් විද්‍යුත් පුස්තකාලය භාවිතා කල හැකිය.

සාමාන්‍ය පුස්තකාල රටාවෙන් මිදී, විද්‍යුත් පුස්තකාල වෙත සම්පවීමේ කාලය දැන් එළඹී ඇත. කාලය හා තොරතුරු වල අගය සීඝ්‍රයෙන් දිනෙන් දින ඉහල යන බැවින් ඉදිරියේදී විද්‍යුත් පුස්තකාල අත්‍යවශ්‍ය අංගයක් වනු ඇත.

මෙවැනි ස්වයංක්‍රීය විද්‍යුත් පුස්තකාලයක්, පළාත් පාලන ආයතනයක් සතුව දැනට ශ්‍රී ලංකාවේ ඇත්තේ බළන්ගොඩ නගර සභාව සතුව පමණි.

### ඔබත් අදම එක් වන්න අප සමග....

## 06. e-balangoda තොරතුරු තාක්ෂණ ප්‍රවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

e-balangoda
it for your life... Urban Council Balangoda

e-balangoda තොරතුරු තාක්ෂණ ප්‍රවර්ධන වැඩසටහනේ මෙහෙයුම් මධ්‍යස්ථානය ලෙස "විදුණැන පියස" යොදා ගැනීමට සූදානම් කර ඇත.

වාපෘතියේ අරමුණ :

බළන්ගොඩ නගර සභා බල ප්‍රදේශයේ ජනතාව වෙත තොරතුරු තාක්ෂණික මෙවලම් හා දැනුම සම්ප කරවීම තුලින් එදිනෙදා කටයුතු කාර්යක්ෂම සහ පලදායි කරවීම හා විශ්ව ගම්මානයට සම්ප කරවීම.

වාපෘතියේ ක්‍රියාකාරකම් :

- ඉන්ටර්නෙට් භාවිත කරන්නන්ට ඉක්මනින් හා පහසුවෙන් තොරතුරු හා සේවා ලබා ගැනීමට මාර්ග උපදේශනය ලබා දීම.
- පාසැල් මට්ටමින් තොරතුරු තාක්ෂණික ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- e-learning, e-channeling, e-library, e-books, e-money, e-magazine, e-card, e-banking, e-commerce ආදි විද්‍යුත් අංග (e-item) හඳුන්වා දීම හා භාවිතා කිරීමට මග පෙන්වීම.
- පරිගණක ආශ්‍රිත නව රැකියා අවස්ථා බිහි කිරීමට අනුග්‍රහය හා උපදේශකත්වය ලබා දීම තුලින් රැකියා වියුක්තිය අවම කිරීම.
- පරිගණක ආශ්‍රිත රැකියා සඳහා පුහුණු ශ්‍රමිකයින් සැපයීම.
- ජාත්‍යන්තර වෙළඳ සබඳතා ගොඩනගා ගැනීමට බළන්ගොඩ ව්‍යාපාරික ප්‍රජාවට මග පෙන්වීම.
- නිදහස් යෙදවුම් මෘදුකාංග සමග ලිනක්ස් (Linux) මෙහෙයුම් පද්ධතිය (Operation System) බළන්ගොඩ ජනතාවට හඳුන්වා දීම.
- ජනතාවට පැනනගින පරිගණක සම්බන්ධ ගැටළු (Hardware සහ Software) නිරාකරණය කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරවීම.
- පරිගණක පාඨමාලා හැදෑරීමට මෙන්ම පරිගණකයක් මිලදී ගැනීමට අපේක්ෂා කරන අය සඳහා මාර්ග උපදේශනය හා සම්බන්ධීකරණය කිරීම.
- පරිගණක පාඨමාලා හැදෑරීමට බලාපොරොත්තු වන, හදාරමින් සිටින ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට හා පරිගණක සම්බන්ධ උනන්දුවක් දක්වන සැමට පරිගණක දැනුම වැඩිදියුණු කිරීමේ වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කිරීම.
- වෙළඳ ආයතන පරිගණක ගත කිරීම සඳහා සියළු පහසුකම් සම්බන්ධීකරණය කිරීම හා මාර්ග උපදේශනය ලබා දීම.
- පරිගණක ක්ෂේත්‍රයේ වන ව්‍යාපාර බිහි කිරීම සඳහා මාර්ග උපදේශනය ලබා දීම හා පවත්වාගෙන යාමේදී ඇතිවන ගැටළු නිරාකරණය කිරීම.

වාපෘතිය මෙහෙයවීම් දායකත්වය :

01. බළන්ගොඩ නගර සභාව
02. බළන්ගොඩ නගර සභා මහජන පුස්තකාලය
03. "විදුනැණ පියස" තොරතුරු මධ්‍යස්ථානය
04. බළන්ගොඩ පරිගණක සමාජය.

වැඩි විස්තර සඳහා..

Tel : 045- 2288737
e-mail : urbanbg@sltnet.lk
URL : www.balangodalibrary.cjb.net
Blog : http://ucbalangoda.wordpress.com